ශීර්ෂය 198 වාරිමාර්ග අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 198 - වාරිමාර්ග අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වාරිමාර්ග අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව වාරිමාර්ග අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වාරිමාර්ග අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූලධන වියදම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කාර්යසාධන වාර්තාව අනුව 2024 දෙසැම්බර් 31 දිනට කිවුල් ලිං ජලාශ ව්‍යාපෘතියේ හා මාදුරුඔය ජලාශ ව්‍යාපෘතියේ සමුච්චිත පිරිවැය පිළිවෙලින් රු.මි. 29.68 ක් හා රු.මි. 906.34 ක් වුවද අමාත්‍යාංශය විසින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වල කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ රු.මි. 31.65 ක් හා මාදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ රු.මි. 390.20 ක් ලෙස දක්වා තිබුණි.	මාදුරු ඔය සහ කිවුල් ඔය ව්‍යාපෘතිවල ඉදිරි කටයුතු මහවැලි අධිකාරිය වෙත පවරා ඇති අතර මේ වන විට අදාල ව්‍යාපෘතිවල කටයුතු නතර කර ඇත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල ජලාශ යටතේ ගිණුගත වී ඇති එම ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශය විසින් දරන ලද වියදම් හඳුනාගෙන සුදුසු පරිදි කටයුතු කරනු ලැබේ.	ව්‍යාපෘතිවල කටයුතු නතර කර තිබුණද නැවත ආරම්භ කර ඒවායේ කටයුතු පැවරීම සිදුවන තෙක් එතෙක් දරන ලද පිරිවැය හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 හා 2025 යන වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමකින් තොරව ඉදිකිරීම් නවතා දමා ඇති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවැති ව්‍යාපෘති සංඛ්‍යාව 03 ක 2024 වාර්ෂික කාර්යසාධන වාර්තාවට අනුව 2024 දෙසැම්බර් 31 දිනට වියදම රු. මි. 5,027.23 ක් වුවද මෙම වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ කෙරීගෙන යන වැඩ යටතේ දක්වා නොතිබුණි.	ඉදි කිරීම් නවතා දමා ඇති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති ව්‍යාපෘති 3 සඳහා 2024.12.31 දක්වා දරා ඇති වියදම තහවුරු කර ගැනීමෙන් අනතුරුව, එකී වියදම මූල්‍ය ප්‍රකාශන තුළ කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	මෙම ව්‍යාපෘති ඉදිරියේදී ආරම්භ කර ප්‍රාග්ධනිත කරන තුරු මූල්‍ය ප්‍රකාශන තුළ කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	මූල්‍ය නොවන වත්කම් සඳහා උමා ඔය හැරවුම් ව්‍යාපෘති පිරිවැය ලෙස ගිණුම්ගත කර ඇති වටිනාකම රු.මි. 17,733.19 ක් වුවද 2024 අගෝස්තු 31 දිනට වූ ව්‍යාපෘති ගිණුම් අනුව එම ව්‍යාපෘතියෙහි පිරිවැය රු.මි.	2024 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි ඉඩම් යටතේ දක්වා ඇති රු.මි. 18,982.97 ක වටිනාකම තුළ	නිම නොවූ ව්‍යාපෘති වල නිවැරදි පිරිවැය කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කළ යුතුය.

	80,820.26 හා 2024 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් 31 දක්වා අමාත්‍යාංශය විසින් දරන ලද පිරිවැය රු .මි. 115.11 ක් වුයෙන් එකතු වටිනාකම රු.මි. 80,935.37 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනයේ අඩුවෙන් දක්වා ඇති ප්‍රමාණය රු. මි. 63,202.18 ක් විය.	උමා ඔය හැරවුම් ව්‍යාපෘතියට අදාළව රු.මි. 17,733.19 ක වටිනාකමක් ගිණුම්ගත වී ඇත. මේ වන විට උමා ඔය ව්‍යාපෘතියට අදාළව පැවති ඉඩම් ‘ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත’ භෞතිකව භාර දී ඇත. එහෙත් එකී ඉඩම්වල මූල්‍යමය වටිනාකම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට පවරා දීමට නොහැකි වී ඇත්තේ ව්‍යාපෘතියට අදාල වියදම් තවමත් සිදුවෙමින් පවතින බැවිනි. ඒ අනුව සමස්ථ කටයුතු අවසානයේ ඉඩම් වල මූල්‍යමය වටිනාකම ගණනය කර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පැවරීමට කටයුතු කරනු ලබන අතර අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	
(iii)	2024 මැයි මස වන විට තල්පිටිගල ජලාශ ව්‍යාපෘතියෙහි සියලු කටයුතු හා වත්කම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඒ සමඟ එම වත්කම්වලට අදාළව වාරිමාර්ග අමාත්‍යාංශයේ වත්කම් යටතේ ගිණුම්ගත වී ඇති රු.මි. 96.96 ක වත්කම් ලැයිස්තුවක්ද වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාරදී තිබුණි. එසේ වුවද 2024 වර්ෂයට අදාළව වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම්හි තල්පිටිගල ජලාශය වෙනුවෙන් 2022 වර්ෂයේ දරන ලද රු. මි. 199.21 ක වියදමක් වත්කම් ලෙස තවදුරටත් දක්වා තිබුණි. තවද 2023 දෙසැම්බර් 31 දිනට තල්පිටිගල ජලාශ ව්‍යාපෘති ගිණුම් අනුව තල්පිටිගල ජලාශය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් දරන ලද මුළු වියදම රු.මි. 646.87 ක් වුයෙන් රු.මි. 350.70 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය මේ වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන බැවින් එකී ව්‍යාපෘතියට අදාළව අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශවල ජලාශ යටතේ ඇතුළත්ව ඇති රු.මි.199.21 ක වටිනාකම අමාත්‍යාංශ ගිණුම්වලින් ඉවත් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට කටයුතු කරනු ලැබේ.	ව්‍යාපෘතිය වෙනුවෙන් අමාත්‍යාංශය මගින් දැරූ නිවැරදි පිරිවැය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පැවරිය යුතු අතර ඒසේ පවරාදීමෙන් පසු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන වලින් එම වත්කම ඉවත් කළ යුතුය.

(iv)	2024 මැයි මස වන විට පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතියෙහි සියලු කටයුතු හා වත්කම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඒ සමඟ වාරිමාර්ග අමාත්‍යාංශයේ වත්කම් යටතේ ගිණුම්ගත වී ඇති රු.මි.38.40 ක වත්කම් අමාත්‍යාංශයේ සිගාස් (CIGAS) පද්ධතියෙන් ඉවත් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාරදී තිබුණි. එසේ වුවද 2024 වර්ෂයට අදාළ වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම්හි ජලාශ යටතේ පහල මල්වතු ඔය ජලාශය සඳහා දරන ලද රු.මි. 495.63 ක වියදමක් වත්කමක් ලෙස තවදුරටත් ගිණුම්වල දක්වා තිබුණි.	පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය මේ වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන බැවින් එකී ව්‍යාපෘතියට අදාළව අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශවල ජලාශ යටතේ ඇතුළත්ව ඇති රු. මි. 495.63 ක වටිනාකම අමාත්‍යාංශ ගිණුම්වලින් ඉවත් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට කටයුතු කරනු ලැබේ.	-එම -
(v)	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය අනුව 2024 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ වාහන 519 ක් ලියාපදිංචි වී තිබුණද, අමාත්‍යාංශය විසින් පරිහරණය කරන ලද වාහන (විදේශ ව්‍යාපෘති භාවිතා කරනු ලබන වාහන හැර) සංඛ්‍යාව 137 ක් ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇති වාහන සංඛ්‍යාව 37 ක් ද විය. ඒ අනුව අමාත්‍යාංශය භාවිතා කරන වාහන 100 ක විස්තර හා ඒවායේ වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ හා ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇති වාහන සංඛ්‍යාව 37ක් වන අතර ඒවායෙහි වටිනාකම රු.මි. 311.84කි. මීට අමතරව අවසාන ගිණුම් වලට ඇතුළත් කළ යුතු අමාත්‍යාංශය සතුව පවතින වාහනවල වටිනාකම මෙම වර්ෂය තුළ ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	අමාත්‍යාංශය සතුව පවතින සියලුම වාහනවල වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර සියළුම වාහන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කළ යුතු අතර සියළුම වාහන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කළ යුතුය.
(vi)	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කළ 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන චක්‍රලේඛය හා 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම කළ යුතු බවට සඳහන් වුවද ,ගිණුම් අංශය විසින් අමාත්‍යාංශයට අයත් ඉහත වාහන 100 සම්බන්ධ වටිනාකම් සමග අනෙකුත් විස්තරාත්මක තොරතුරු ඇතුළත් ස්ථාවර වත්කම් ලේඛනයක්	01/2017 චක්‍රලේඛය ප්‍රකාරව වාහන සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යෑමට කටයුතු කරනු ලැබේ.	චක්‍රලේඛ ප්‍රකාරව සියලුම වාහන සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යෑමට කටයුතු කළ යුතුය.

පවත්වාගෙන ගොස් නොතිබුණි. එබැවින් ඉහත වාහන 100 සම්බන්ධ පිරිවැය වටිනාකම් නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකි විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීම සඳහා මුළු අග්‍රිම අවශ්‍යතාව වූ රු. මි.14,190.18 ක් විය. එයින් ලැබී තිබුණු මුළු අග්‍රිමය රු. මි.11,280.38 ක් වූ අතර උපයෝජනය කිරීමෙන් තොරව ආපසු හරවා යවන ලද වටිනාකම රු.මි. 1,451.78 ක් එනම් සියයට 12.86ක් විය. මෙයින් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 03ක ඌන උපයෝජනය මත නැවත භාණ්ඩාගාරය වෙත හරවා යවන ලද අග්‍රිමය පමණක් රු. මි. 1,358.41 ක් වී තිබුණි.	උපයෝජනය කිරීමකින් තොරව භාණ්ඩාගාරය වෙත ආපසු හරවා යවන ලද වටිනාකම රු.මි. 1,451.78 ක් බව පිළිගනිමි. අමාත්‍යාංශය මඟින් භාණ්ඩාගාරයෙන් අග්‍රිම අයදුම් කරනු ලබන්නේ එක් එක් ව්‍යාපෘති වල ගණකාධිකාරීවරු විසින් ඔවුන්ට අවශ්‍ය අක්මුදල් ප්‍රමාණය දන්වා එවීමෙන් අනතුරුවයි. කෙසේ වෙතත් මෙලෙස අනවශ්‍ය පරිදි අග්‍රිම අයදුම් නොකිරීම හා රඳවා නොගැනීම සම්බන්ධයෙන් 2025 වර්ෂය ආරම්භයේ සිට ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව 2025 ජනවාරි 27 වන දින රැස්වීමක් පවත්වා සියළු ව්‍යාපෘති හා ආයතනවල ගණකාධිකාරවරු දැනුවත් කරන ලදී.	අග්‍රිම ඉල්ලුම් කිරීමේදී නිවැරදි පුරෝකථනයන් මත පදනම්ව අවශ්‍යතා හඳුනාගෙන අවශ්‍ය අක්මුදල් ප්‍රමාණය පමණක් ඉල්ලුම් කිරීමත් අනවශ පරිදි රඳවා නොගැනීම සඳහාත් කඩිනම් ක්‍රමවේදයක් හඳුන්වාදීම හා එම කටයුතු සම්බන්ධව නිරන්තර අධීක්ෂණයක් පවත්වාගෙන යාම කළ යුතුය.

3.2 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
හිඟ ආදායම් ප්‍රකාශය අනුව මොරගහකන්ද ජල විදුලි බලාගාර ව්‍යාපෘතියට අදාළව ජල විදුලිය විකිණීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම රු.මි.447.32 ක් වූ අතර එයින් රු.මි.434.41 ක් 2024 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වාද, රු.මි.11.22 ක් 2023 වර්ෂයට අදාළවද, රු.මි. 1.69 ක මුදලක් 2022 හා 2021 වර්ෂවලට අදාළවද හිඟ හිටව පැවතුණි.	මේ වන විට 2021,2022 සහ 2023 වර්ෂ සඳහා හිඟහිටි ආදායම් නොමැති අතර, ඉදිරියේදී ලැබීම් ප්‍රමාද වීම් සිදුවුවහොත් පොලී මුදලක් අයකිරීමට හැකි වනසේ ගිවිසුම් යාවත්කාලීන කිරීමේ හැකියාව සොයා බැලීම පිළිබඳ සටහන් තබා ගතිමි.	මාසිකව ලැබිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට වැඩ පිළිවෙලක් හඳුන්වාදිය යුතුය.

3.3 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඇස්තමේන්තු සකස් කිරීමේදී අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව මුදල් වෙන්කර ගැනීම, සැලසුම් කළ පරිදි වැඩ කටයුතු නොකිරීම යන හේතු නිසා 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූලධන වියදම් වැය විෂය 03 ක් සහ පුනරාවර්තන වියදම් වැය විෂය 03 ක් සඳහා වෙන්කරන ලද පිළිවෙලින් රු.මි. 13.00 ක් සහ රු.මි 2.14 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන උපයෝජනය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි.	විගණන ඡේදයේ සඳහන් වැය විෂයයන් යටතේ ප්‍රතිපාදන ලබාගෙන තිබූ ප්‍රමාණයන් වියදම් නොකර ඉතිරිවීම පිළිගනිමි. 2026 ඇස්තමේන්තු සකස් කිරීමේදී නිවැරදි පරිදි ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරමි.	නිවැරදි ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	වැය විෂයන් 24 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.මි.11,308.87 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනවලින් එකතුව රු.මි. 5,077.85 ක් හෙවත් සියයට 44.9 ක් ඉතිරිව් තිබුණි. එහිදි එක් එක් වැය විෂයන් හි ඉතිරිය සියයට 32 ත් සියයට 91 ත් අතර පරාසයක් ගෙන තිබුණි.	- එම -	- එම - .

3.4 තැන්පත් ශේෂ

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය අවසාන දිනට වර්ෂ 02 ක කාලයක් ඉක්මවා පොදු තැන්පත් ගිණුම්වල තිබුණු	කළුගඟ වම් ඉවුර සංවර්ධන ව්‍යාපෘතියේ රැඳවුම් මුදල වන රු.මි. 2.11 ක මුදල නිදහස් කර	දීර්ග කාලීනව පවත්නා තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය.

කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවා ගැනීම් රු.මි.4.17 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ගන්නා ලෙස ත්‍රිකුණාමලය වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත දන්වා ඇත. නිල්වලා එළිය සංවර්ධන ව්‍යාපෘතියෙහි රැඳවුම් මුදල් වන රු.මි. 1.96 ක මුදල නිදහස් කර ගන්නා ලෙස ගාල්ල වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත දන්වා ඇත. රු.49,004 ක මුදල සඳහා අදාල ආයතන මඟින් රැඳවුම් මුදල් නිදහස් කර ගැනීමට ඉල්ලීම් කර නොමැති අතර මේ පිළිබඳව අදාල ආයතන දැනුවත් කර ඇත. ජුනි මස 15 දිනට පෙර මේ පිළිබඳ තහවුරුවක් නොලදහොත් ජුනි මස රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. රු.48,537ක මුදල ජුනි මස රජයේ ආදායමට බැර කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.	

3.5 බැරකම් හා බැඳීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 හි 2 (ඇ) ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේ දී නිදහස් කළ යුතු අතර කිසිදු බැරකමක් ඊළග වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතුය. එහෙත් 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂයට අදාළ ගෙවීම් වර්ෂය තුල සිදු කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් අවස්ථා 206 ක දී රු.මි. 93.79 ක බැරකම්වලට එළඹී තිබුණි.	2024 දෙසැම්බර් ගිණුම් පියවන විට අමාත්‍යාංශයේ බැරකම් නොතිබුණ අතර ඉන්පසුව 2025 ජනවාරි මස පෙර වර්ෂයට අදාල වවුචර්පත් ලැබුණි. මෙහිදී 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද SA/92 වාර්තාව අනුව පැවති බැරකම් සඳහා 2024 වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි.	වර්ෂයට අදාළ ගෙවීම් වර්ෂය තුළදී නිදහස් කිරීමට වැඩ පිළිවෙලක් හඳුන්වා දිය යුතුය.

3.6 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට වූ ලිඛිත ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා එවැනි සමාලෝචනයක් සිදු කිරීමට නොහැකි වූ අතර 2025 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය		
මෙම ව්‍යාපෘතිය ඇ.එ.ජ.ඩො.මි. 690 ක ට ඉදිකිරිමට චීන ඉදිකිරීම් සමාගමක් වෙත ප්‍රදානය කර කොන්ත්‍රාත් ගිවිසුම 2014 නොවැම්බර් මස 05 දින අත්සන් කර තිබුණි. ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කර 2017 වර්ෂයේ නිම කිරිමට සැලසුම් කර තිබුණද මෙහි ඉදිකිරිම් 2025 අප්‍රේල් 30 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. මෙහිදී වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 ක් එනම් ඇ.එ.ජ.ඩො.මි. 34.5 කට සමාන රු.මි. 4,011.04 ක් කොන්ත්‍රාත්කරු වෙත 2015 ජනවාරි 07 වනවිට ගෙවා තිබුණද, මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ඇතිවිය හැකි පාරිසරික බලපෑම් පිළිබඳව පවතින අවිනිශ්චිතතාව මත විධිමත් විමර්ෂණයක්	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ව්‍යාපෘතිය නිවැරදි ලෙස හඳුනාගැනිම, ව්‍යාපෘතිය ඇගයීමට ලක් කිරිම (project Appraisal) හා පාරිසරික බලපෑම් ඇගයිම් සිදු කිරිම, ඉඩම් අත්පත් කරගැනීම, වන්දි ගෙවීම, නැවත පදංචි කිරීම් වැනි ප්‍රධාන ආරම්භක ක්‍රියාකාරකම් වලින් පසු ව්‍යාපෘති කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතු අතර එසේ නොකිරිම සම්බන්ධයෙන් නිලධාරින් වගකිව යුතුය. එසේම පරිසර බලපෑම් ඇගයිම් වාර්තාව සඳහා වූ අනුමැතීන් ලබා ගැනීම

කිරිමට ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් නියම කිරිම මත ව්‍යාපෘතිය 2015 වර්ෂයේ සිට නවතා දමා තිබුණි.

මෙහිදී පරිසර බලපෑම් ඇගයිම් වාර්තාව සකස් කිරිම සඳහා මහවැලි උපදේශන කාර්යාංශය සමග රු.මි. 38.85 ක කොන්ත්‍රාත් ගිවිසුමකට එලඹ ඒ සඳහා රු.මි.16.56 ක මුදලක් ගෙවා තිබුණු අතර එම වාර්තාව 2024 අගෝස්තු 27 දින ලබාදී තිබුණි. ඒ සඳහා 2025 සැප්තැම්බර් 30 වන විටත් අනුමැතිය ලැබී නොතිබුණි.

කාර්යසාධන වාර්තා හා ගිණුම් වාර්තා අනුව 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.මි. 4,091.21 ක් රජය විසින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දරා තිබුණ ද ආර්ථිකයට ඉන් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

කඩිනම් කර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. තවද අයවැයෙන් වෙන් කරන මුදල් අදාල වර්ෂයේදී වැය කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) **මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය**

(i) මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේ සිට වර්ෂ 11 ක් තුළ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදී තිබුණු අතර 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා එකතුව රු.මි.14,500 ක ප්‍රතිපාදන වෙන් කිරීමට මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවයද ලැබී තිබුණි. එසේ වුවද ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම 2021 දක්වා ප්‍රමාදකර තිබීම හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා පමණක් වර්ෂ 11 ක කාලයක් ගත වී තිබුණි. පසුව මෙම ව්‍යාපෘතිය සඳහා 2021 සිට 2023 වර්ෂය දක්වා රු.මි. 1,689 ක මුදලක් වෙන්කර තිබුණ ද ඉන් වැයකර තිබුණු මුදල රු.මි. 906.34 ක් පමණක් විය. මෙම දකුණු ඇල සංවර්ධන ව්‍යාපෘතිය තුළින් කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 14,000 ක ප්‍රමාණයක් වගා කල හැකිවීමත්, මෙම වකවානුව තුළ ක්‍රියාත්මක අනෙකුත් ව්‍යාපෘතීන් හා සාපේක්ෂව වැඩිම ප්‍රතිලාභයක් අත්වන හා පරිසරයට වන හානිය අවම මට්ටමක පැවතියද මෙම ව්‍යාපෘතිය සඳහා වැඩි ප්‍රමුඛතාවයක් දක්වා නොතිබුණි.

මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවිම නිසා, මාදුරු ඔය වම් ඉවුර සංවර්ධන කටයුතු පළමුව ආරම්භ කර අර්ධ වශයෙන් ඉදිකිරිම් කටයුතු නිමවන ලදී. එසේ වුවද මාදුරු ඔය ජලාශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ පූර්ණ ප්‍රතිලාභ ලැබීම සඳහා මාදුරු ඔය දකුණු ඉවුර ප්‍රදේශය හා අර්ධ වශයෙන් නිම කර ඇති වම් ඉවුරද සංවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.
අග්‍රමාත්‍ය ලේකම්ගේ 2022.10.07 දිනැති ලිපිය මගින් RAMP කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට, අර්ධ වශයෙන් නිමකර ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට අදියර වශයෙන් ක්‍රියාත්මක කල හැකි වැඩසටහනක් කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. ඒ අනුව අදියර ලෙස ක්‍රියාත්මක කිරීමට වැඩසටහනක් ඉදිරිපත් කරන ලදී. ජාතික මෙහෙයුම් මැදිරියේ කැඳවුම්කරු /

ප්‍රමුඛතාවය මත අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති ආරම්භ කර අපේක්ෂිත ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය.
තවද අයවැයෙන් වෙන් කරන මුදල් අදාල වර්ෂයේදී වැය කිරීමට කටයුතු කළ යුතුය.

		ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්ගේ 2023.10.11 දිනැති ලිපියට අනුව, ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම සඳහා සුදුසු වාණිජ සහකරුවෙකු රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ සොයා ගන්නා ලෙස උපදෙස් ලබා දී ඇත .	
(ii)	වම් ඇලේ කි.මී.52+812 දරන ස්ථානයෙන් ආරම්භවන LB L 8 ඇලේ කි.මී. 9+200 දක්වා සම්පූර්ණයෙන් කොන්ක්‍රීට් කර තිබුණු අතර කුඹුරු අක්කර 6,152 ක් වගා කිරීමට සැලසුම්කර තිබුණි. එහෙත් කි.මී.0 සිට කි.මී 2 +300 දක්වා කොටසේ කුඹුරු අක්කර 940 ක් පමණක් වගා කිරීම සිදු කෙරුණි. කොන්ක්‍රීට් කර තිබුණ ඇල මාර්ගය නඩත්තුවක් සිදු ව නොතිබුණු බැවින් ඇල තුළට පස් වැටී, ඇල මාර්ගය හඳුනාගත නොහැකි වන ලෙසට ගස් වැවී තිබීමත් ස්ථාන කිහිපයක නිර්මිතයන්ටද හානි සිදුවී තිබුණි.	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගැසට් නොකරන ලද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් කලාප 4 කොටසට අයත් රන්සරතැන්න වැව හා පහළ නිම්න කොටස සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සැලසුම් සකස් කර ඇස්තමේන්තු සකසා ඇත. මේ සඳහා 2026 වර්ෂයේදී ප්‍රතිපාදන ලබාගෙන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.	අත්හැර දමා ඇති ව්‍යාපෘති නැවත ආරම්භ කරන තුරු ඉදිකරන ලද කොටස් ස්වභාවික ආපදාවන් තුළින් සිදුවන හානීන්ගෙන් ආරක්ෂා වන පරිදි නඩත්තු කර පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.
(iii)	ඇල මාර්ගයේ කිලෝමීටර් 6+500 සිට 14+292 දක්වා වූ කොටස ඉදිකිරීම කොන්ත්‍රාත් පැකේජ් 12 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද අතරමැද පිහිටි කිලෝමීටර් 7+500 සිට 8+800 කොටස රු.මි. 118.51 කට හා කිලෝමීටර් 10+800 සිට 11+483 දක්වා කොටස රු.මි. 99.08 කට අවසන් කර තිබුණි. එහෙත් ඇලෙහි ඉතිරි කොටස් නිම නොකිරීම නිසා ඉදිකළ කොටසෙන් ආර්ථික ප්‍රතිලාභ ලබාගත නොහැකිවී තිබුණි. තවද කිලෝමීටර් 11+ 483 හා 12+430 ස්ථානයේ පිහිටි අරංගොඩ වැවේ සම මට්ටම් පැන්නුමේ ඇතුල්වාන හා පිටවානෙහිද ඉදිකිරීම් ආරම්භකර නොතිබුණි.	කොන්ත්‍රාත් ගිවිසුම්වලට අනුව, කොන්ත්‍රාත්කරුවන්ට හෝ ව්‍යාපෘතියට පාලනය කල නොහැකි හේතු එකින් එක විශ්ලේෂණය කර, ඊට අදාලව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම් ලබා දී ඇත. නමුත් එම දීර්ඝ කරන ලද කාලය තුලද කොන්ත්‍රාත්කරුවන්ට හෝ ව්‍යාපෘතියට පාලනය කල නොහැකි හේතු මත හා කොන්ත්‍රාත්කරුවන්ගේ ලිඛිත ඉල්ලීම මත, එකදිගට දින 84ක් හෝ විටින් විට දින 159ට වඩා කාලයක් සියලුම වැඩ නවතා දැමීම යන කරුණු මත කොන්ත්‍රාත්තුවේ කොන්දේසිව ල 20.6 වගන්තිය සහ 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 ජාතික අයවැය චක්‍රලේඛය අනුව අන්‍යෝන්‍ය (විකල්ප) අවසන් කිරීම නිර්දේශ කරන	සීමිතව ලැබෙන ප්‍රතිපාදන තුළින් තැනින් තැන ඉදිකිරීම් කොටස් වශයෙන් සිදුකරනු වෙනුවට ඉදිකිරීම් ප්‍රමුඛතාව හඳුනාගෙන ප්‍රතිලාභ අත්වන පරිදි ප්‍රතිපාදන උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය.

	ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අන්‍යෝන්‍ය වශයෙන් කොන්ත්‍රාත් ගිවිසුම් අවසන් කරන ලදී.	
(iv) කිනානී වැවේ හා මීමින්නාගොල්ල වැවේ ඇතුල්වානේ හා පිටවානේ රු.මි. 158.27 ක් වූ වැඩ අයිතම 124 ක් සිදු නොකර ඉතිරිවී තිබුණි. 2023 වර්ෂයේ මෙම ඉදිකිරීම් අවසන් කිරීමට ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් එහි වැඩ අවසන් කරවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ඉදිකිරීම්වල කම්බි වැසෙන ලෙස තාවකාලික කොන්ක්‍රීට් ස්තරයක් දමා තිබුණි. ඒ සඳහා රු.මි.22.08ක් වැය කර තිබුණි.	ඉහතින් සඳහන් කර ඇති කරුණු අනුව කිනානි හා මීමින්නගොල්ල වැව්වල ඇතුළුවන් හා පිටවන් නිර්මිත වල වැඩ නිමකල නොහැකි විය. එසේම ජාතික මෙහෙයුම් මැදිරියේ කැඳවුම්කරු / ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්ගේ "ජාතික මෙහෙයුම් මැදිරිය - රැස්වීම් වාර්තාව" යන මැයෙන් යොමුකළ අංක DPMM/NOR/1-3 හා 2023.10.11 දිනැති ලිපියට අනුව, සුදුසු ආයෝජකයෙකු සොයාගන්නා තුරු, අර්ධ වශයෙන් නිම කර තිබූ කොන්ත්‍රාත් වල වැඩ ආරක්ෂාකාරී ලෙස නතර කරන මෙන් දැනුම් දී තිබුනි. මේ අනුව කිනානි හා අරංගොඩ වැව්වල ඇතුල්වීමේහා පිටවීමේ නිර්මිත වල ආවරණය වී තිබූ කම්බි (Reinforcements) දිරාපත් වීම වැළක්වෙන සේ එම කම්බි වැසෙන පරිදී පමණක් කොන්ක්‍රීට් ආවරණයක් දැමීම සිදු කරන ලදී.	තාවකාලිකව කොන්ක්‍රීට් ස්ථරයක් දැමීමට වැය කල මුදල සඳහා නියමිත කාලය තුලදි ඉදිකිරීම් සිදු කිරීමට කටයුතු නොකල නිලධාරීන් වගකිව යුතු බැවින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා රජයට සිදු වී ඇති අලාභයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) **කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තු පිරිවැය රු. මි. 8,000 ක් හා ව්‍යාපෘති කාලය අවුරුදු 04ක් විය. 2023 වර්ෂය දක්වා සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු. මි. 29.67ක් වූයෙන් සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 3.45 ක් වැනි අඩු අගයක් විය. මෙම ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේ සිට ප්‍රතිපාදන වෙන්කිරීම නවතා දමා තිබුණු බැවින් මේ දක්වා දරන ලද වියදමෙන් ආර්ථිකයට කිසිදු ප්‍රතිලාභයක් අත් වී නොතිබුණි	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ව්‍යාපෘති ඉදිකිරීම් නැවත ආරම්භ කිරීමට කටයුතු කර අපේක්ෂා කල ප්‍රතිලාභ මහජනයා වෙත කඩිනමින් ලබා දීමට කටයුතු කළ යුතුය. අයවැයෙන් වෙන් කරන මුදල් අදාල වර්ෂයේදී වැය කිරීමට කටයුතු කළ යුතුය.

4.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය		
(i)මෙම ව්‍යාපෘතිය යටතේ මුලස්ථායි ඉදිකිරිම් හා ජල විදුලි බලාගාරයේ ඉදිකිරිම් ඉරාන රජයේ ආධාර ඇතිව ඉරානයේ සමාගමක් සමග ගිවිසුම්ගතව 2010 වර්ෂයේ සිට 2015 මාර්තු වන විට වර්ෂ 05 කින් නිම කිරීමට මුලිකව සැලසුම් කර තිබුණි. එදිනට නිම කිරීමට අපොහොසත්ව ව්‍යාපෘති කාලය 2024 මාර්තු 31 දක්වා දිර්ඝ කරගෙන තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය 2015 මාර්තු සිට 2024 අප්‍රේල් 03 දක්වා අවුරුදු 09 ක කාලයක් මුලස්ථායි ඉදිකිරිම් ඇතුලු ජල විදුල බලාගාරයේ ඉදිකිරිම් ප්‍රමාද වී තිබුණි. මේ හේතුවෙන් මෙගා වොට් 120ක ජල විදුලියක් විදුලි බල පද්ධතියට එක් කිරිම ප්‍රමාද වි තිබුණි. ඊට අමතරව 2020 අප්‍රේල් සිට ජල විදුලිය නිපදවා සැලසුම් කල ජල ප්‍රමාණය කිරිදි ඔය ද්‍රොණියට මුදා හැරිම සිදු වුවද පහළ නිම්නයේ අදාල නිර්මිතයන් 2025 සැප්තැම්බර් 30 දක්වා පුර්ණ ලෙස නිම නොකිරිම හේතුවෙන් නව ඉඩම් හෙක්ටයාර 4500 ක් හා වගා කෙරෙන ඉඩම් හෙක්ටයාර 1500 ක් සඳහා වාරි ජලය සැපයීම, මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සම්පුර්ණ කිරීම ප්‍රදේශයේ ග්‍රාමිය ආර්ථිකය නගාසිටුවිම මෙන්ම පාරිසරික තත්ත්වය වැඩි දියුණුව ඇතුළු සංවර්ධන ප්‍රතිලාභ රැසක් අහිමි වී තිබුණි.	මෙවැනි ව්‍යාපෘතියක සම්පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ව්‍යාපෘතියේ වැඩ කටයුතු මුළු මනින්ම අවසන් විය යුතුය. එසේ වුවද අලුත් ඉඩම් හෙක්ටයාර් 4500 ට හා වගා කරන ඉඩම් හෙක්ටයාර් 1500 ට වාරි ජලය සැපයීමට නම් උමං පද්ධතිය සම්පූර්ණයෙන් ජලයෙන් පිරවිය යුතු අතර විදුලි උත්පාදනයෙන් පසුව ජලය මුදා හැරිය යුතුය. උමං පද්ධතියේ සහ ජල විදුලි නිෂ්පාදනයට පැවති යම් යම් බාධක හේතුවෙන් ඉහත පරිදි විදුලි බලය උත්පාදනයෙන් පසුව මුදා හැරිය යුතු ජලය මුදා හැරීම ප්‍රමාද වූ නමුත් උමා ඔය පහල නිම්න සංවර්ධනය කිරීම මගින් අලුත් ඉඩම් 4500 හා වගා කරන ඉඩම් 1500ක වගා කටයුතු 25% කට පමණ එම කාලය තුල වාරි ජලය සපයන ලදී. ඒ අනුව ව්‍යාපෘතියේ සම්පූර්ණ ප්‍රතිලාභ ලබා දෙන තුරු ඉහත පරිදි මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල ජනතාවගේ ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම හා පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරිමට මෙම ව්‍යාපෘතිය මගින් එම කාල සීමාව තුල යම් කිසි දායකත්වයක් ලබා දී ඇත.	අපේක්ෂිත පරිදි ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති නිමකිරීම සඳහා ආයතනයට ඇති ඉදිකිරීම් හා මුල්‍යමය හැකියාව සලකා බැලීමෙන් පසුව පමණක් ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළ යුතු අතර කඩිනමින් ව්‍යාපෘති නිමකර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනිමට කටයුතු කළ යුතුය. අයවැයෙන් වෙන් කරන මුදල් අදාල වර්ෂයේදී වැය කිරීමට කටයුතු කළ යුතුය.
(ii)2023 අගෝස්තු 31 දිනට පිළියෙල කරන ලද ව්‍යාපෘති අවසන් ගිණුම් අනුව ව්‍යාපෘතියෙහි ප්‍රධාන උමගෙහි ඇති වු ජල කාන්දුව සඳහා කොන්ත්‍රාත්කරු විසින් වින්දිත පාර්ශව වෙත ගෙවිය යුතු වන්දි වෙනුවෙන් රජයේ මුදලින් ගෙවා තිබුණු	විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. එම වන්දි මුදල අන්තර් බිල් පත් වලින් අය කිරිම තාවකාලිකව නවතා තිබූ අතර අංක IR/2023/49 හා 2024 සැප්තැම්බර් 09 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි එම වන්දි මුදල රඳවා ගත් මුදල් වලින් අය කර ගැනීම	වන්දි ලෙස ගෙවු මුදල කොන්ත්‍රාත්කාර සමාගමෙන් අය කර ගත යුතු අතර මෙතෙක් එම මුදල අය කර ගැනිමට කටයුතු නොකල නිලධාරින් ඒ සඳහා

රු.මි.1,127.59 ක මුදලක් කොන්ත්‍රාත්කාර ඉරාන සමාගමෙන් අය විය යුතු වුවත් එම මුදල 2025 අප්‍රේල් 30 දින දක්වා අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.	සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය තීරණය කර ඇති බව සඳහන් කර ඇත.කෙසේ වුවද දෝෂ නිවැරදි කිරිමේ කාලය අවසන් වී නොමැති බැවින් රඳවා ගත් මුදල් වලින් ඉතිරි කොටස නිදහස් කර නැත.(මෙම රඳවා ගත් ඉතිරි මුදල මෙම වන්දි මුදල ගෙවීම සඳහා ප්‍රමාණවත් නොවන බවද නිරික්ෂණය වේ.)	වගකිව යුතුය.
(iii)උමා ඔය පහල නිම්න ව්‍යාපෘතිය යටතේ වු රු.මි.11,061.50 ක ඉදිකිරීම් හා ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදී ගත් වත්කම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත හා වෙනත් රජයේ ආයතනය වෙත භාරදුන් ලෙසට සඳහන් කර ගිණුම් සකසා තිබුණද, අදාළ පාර්ශවයන් විසින් වත්කම් පරීක්‍ෂාවට ලක්කර භාරදිම හා භාරගැනිම ලිඛිතව සිදුකිරීමක් කර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	වත්කම් හරදිම හා භාර ගැනිම සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි ලබාගෙන ඉදිරිපත් කල යුතුය.
(iv)උමා ඔය ව්‍යාපෘතියට අනුව ඉහල නිම්නයේ ඉදිකිරීම් වලට අදාළව හාලි ඇල, වැලිමඩ හා ඌව පරනගම බල ප්‍රදේශවල ගොවිබිම් අහිමි වු පවුල් 279 ක් සඳහා පහළ නිම්නයේ වැල්ලවාය හා හල්දුම් මුල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවලින් ගොඩ සහ මඩ ඉඩම් ලබාදීමට කටයුතු කලද එසේ හඳුනාගෙන තිබු ඉඩම්වල අනවසර පදිංචිකරුවන් විසින් අල්ලාගැනීම, දැඩි වනගහනය, වන අලි තර්ජන, පදිංචි ස්ථානයේ සිට අධික දුරක් පැවතිම, පාරිසරික හා සමාජ විෂමතාවයන්ට හැඩ ගැසිම් දුෂ්කරතා මත එම ඉඩම් ලබාගැනීම ප්‍රතික්ෂේප කර තිබුණු අතර එම ගොවි ඉඩම් ලබාදීමේ ගැටලුව විසඳී නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ගොවිබිම් අහිමි පවුල් සඳහා සුදුසු ඉඩම් ලබා දිමට වැඩපිළිවෙලක් හඳුන්වාදිය යුතුය.

4.3 විදේශ ආධාර ව්‍යාපෘති

(අ)

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩ සටහන් ප්‍රවේශ ව්‍යාපෘතිය		
(i)	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් අධික බලපෑම් සහිත කාලගුණික විපර්යාස සහ ජල විද්‍යාත්මක උපද්‍රව පිළිබඳ අනතුරු ඇගවීම වැඩිදියුණු කිරීම සහ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා කැළණි ද්‍රෝණියේ බහුකාර්ය ජල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු විය. මෙහි ඇස්තමේන්තු මුළු පිරිවැය ඇ.එ.ජ.ඩො.මි 93 කට සමාන රු.මි.27,900 ක් වූ අතර ඉන් ඇ.එ.ජ.ඩො.මි. 92 කට සමාන රු.මි.27,600 ක මූල්‍ය දායකත්වය ලෝක බැංකුව විසින් ලබා දීමට එකඟවී තිබුණි. මෙම ව්‍යාපෘතිය 2021 ඔක්තෝබර් 12 වන දින ආරම්භ කර 2026 දෙසැම්බර් 31 දිනට නිම කිරීම සඳහා සැලසුම් කර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘති කාලයෙන් අවුරුදු 03 කට වඩා වැඩි කාලයක් ගත වී ඇතත් මෙහි සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 41.6 ක් හා සියයට 10.49 ක් වැනි අඩු ප්‍රගතියක් විය.	මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම ව්‍යාපෘති කළමනාකරණයෙන් පරිබාහිරව සිදු වූ බාධක හේතුවෙන් ව්‍යාපෘති කටයුතු වල අඩු කාර්යසාධනයක් 2023 වර්ෂය දක්වා පැවති අතර එම තත්ත්වය මඟහරවාගෙන නව උපාය මාර්ග සැලැස්මකට අනුව ප්‍රසම්පාදන සැලැස්ම ද සංශෝධනය කර ලෝක බැංකුවේ අනුමැතිය ලබා ගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.	සැලසුම් කල දිනට ව්‍යපෘති නිමකිරීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර අයවැයෙන් වෙන් කරන ලද මුදල් අදාල වර්ෂයේදීම වැය කිරීමට කටයුතු කළ යුතුය..
(ii)	ව්‍යාපෘතිය යටතේ අඹතලේ පවතින ලවණතා බාධකය වෙනුවට නව ලවණතා බාධකයක් ඉදි කිරීම යන ප්‍රධාන ඉදිකිරීම් සංරචකයේ කාර්යසාධනය ඉතාමත් පහල මට්ටමක පැවතුණි. ව්‍යාපෘතිය ආරම්භ කර මේ වන විට වසර 3 කට වැඩි කාලයක් ගතකර තිබුණද ලවණතා බාධකය ඉදිකිරීම ආරම්භ කිරීම සඳහා වන සැලසුමවත් නිම කිරීමට නොහැකිවීම ගැටලු සහගතවිය.	සැලැස්ම නැවත සමාලෝචනය කර වැඩිදියුණු කිරීමට ටෙන්ඩර් පත්‍රිකා පිළියෙළ කිරීම සඳහා බඳවා ගත් උපදේශන සමාගම මූලික සැලැස්ම සමාලෝචනය කිරීමේදී එය සම්පූර්ණ නොමැති බැවින් අඩුපාඩු රැසක් පවතින නිසා මූලික සැලසුමට විචලනයන් නිර්දේශ කර ඇත. එම නිර්දේශ සඳහා ලෝක බැංකුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමේදී උපදේශන සමාගමේ එක් පාර්ශව කරුවකු ලෝක බැංකුව විසින් අසාදු ලේඛනයට ඇතුළත් කිරීම නිසා එය අනුමත කර ගැනීමට නොහැකි	ව්‍යාපෘතිය අවසන් වීමට පෙර ලවණතා බාධකය නිම කිරීම සඳහා සෑම පියවරක්ම ගත යුතුය.

	විය. මෙම තත්ත්වය මත ලවණතා බාධකය ඉදිකිරීමට තරම් ප්‍රමාණවත් කාලයක් ව්‍යාපෘතියේ මෙම අදියරේ තවදුරටත් නොමැති බැවින් පසුගිය ලෝක බැංකු නිරීක්ෂණයේදී මෙම ලවණතා බාධකය ඉදිකිරීමේ කටයුතු ව්‍යාපෘතියේ දෙවන අදියර දක්වා ප්‍රමාද කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී. ව්‍යාපෘතියේ පළමු අදියරේදී ඉහත කී මූලික සැලැස්ම වැඩිදියුණු කර අවසන් ඉදිකිරීම් සැලැස්ම සකසා ලංසු ලේඛන සකස් කිරීම පමණක් සිදු කරනු ලැබේ. එම කටයුතු ලබන වසර අවසන් වීමට ප්‍රථම නිම කරනු ලැබේ.	

4.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාරිමාර්ග අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වාහන 519 අතරින් වාහන 69 ක් පමණක් අමාත්‍යාංශයෙහි ප්‍රවාහන අංශයේ පාලනය හා මෙහෙයවීම යටතේ පවතින අතර ඉතිරි වාහන 450 ක් අමාත්‍යාංශයෙහි ප්‍රවාහන අංශයේ පාලනය හා මෙහෙයවීමෙන් තොරව පරිහරනය කරනු ලබන බව නිරීක්ෂණය විය. මෙම වාහන 450 න් අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතන, හා පිටස්තර ආයතන විසින් පරිහරනය කරනු ලබන වාහන සංඛ්‍යාව 333 ක් විය. ඒ අනුව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛනයෙහි 02 වගන්තිය ප්‍රකාරව රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින් ලියාපදිංචි කර තිබිම අනිවාර්ය වුවද ඒ සඳහා පියවර ගෙන නොතිබුණි.	2025 අප්‍රේල් 30 දිනට අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වාහන 590 ක් පවතින බවට තොරතුරු වාර්තා වී ඇති අතර ඉන් 69 ක් මේ වන විටත් අමාත්‍යාංශයේ පාලන අංශයේ මෙහෙයවීම යටතේ පවතී. වෙනත් ආයතන යටතේ භාවිතා කරන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති වාහන එම ආයතන වෙත පවරාදීමේ කටයුතු සිදු කිරීම සඳහා එම වාහන සම්බන්ධ තොරතුරු තහවුරු කර ගැනීමට තොරතුරු විමසා ඇත. එම තොරතුරු කඩිනමින් ලබා ගැනීමෙන් පසුව අදාල පවරාදීම් කටයුතු සිදුකළ හැක. මේ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා මහවැලි අධිකාරිය වෙතින් කරුණු විමසා ඇත.	රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතු අතර අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති සියළුම වාහනවල පැවැත්ම තහවුරු කර ගත යුතුය. රජයේ වාහන පිටස්තර ආයතන වලට ලබාදීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	අමාත්‍යාංශ ලේකම් නමින් ලියාපදිංචි කර ඇති, අධික වෙළෙඳපොල වටිනාකමකින් යුත් අධි සුඛෝපභෝගී ගණයට වැටෙන එන්ජින් ධාරිතාවය 1800 CC ට වඩා වැඩි පෙට්‍රල් වාහන 01 ක් හා එන්ජින් ධාරිතාවය 2300 CC ට වඩා වැඩි ඩීසල් වාහන 07 ක් භාවිතයෙන් තොරව අමාත්‍යාංශ භූමිය තුළ විවෘත පරිසරයට නිරාවරණය වන ලෙස වසරකට වැඩි කාලයක සිට ගාල් කර තිබෙන අයුරු 2025 අප්‍රේල් 29 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	වත්කම් කලමනාකරණ චක්‍රලේඛ අංක: 05/2024 අනුව 1800CC/2300CC ට වැඩි වාහන වෙන්දේසි කිරීම සඳහා වාහන 41ක තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යොමු කර ඇත. ඉන් වාහන 22 ක් නැවත අමාත්‍යාංශයේ පරිහරණය සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇත. ඉතිරි වාහන 19 වෙන්දේසි කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරමින් පවතී. එම කටයුතු කඩිනම් කිරීමට සටහන් කර ගතිමි.	අවශ්‍යතාවයට නොගැලපෙන මෙවැනි වාහන මිලදී ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර අපහරණය කිරීමට යෝජනා වී ඇති වාහන තවදුරටත් ප්‍රමාද නොකර අපහරණය කල යුතුය.
(ඇ)	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට අනුව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි වාහන 06 ක් මහවැලි අධිකාරියට අයත් තඹුත්තේගම කලාප කාර්යාලය තුළ තැනින් තැන ගාල් කර හා ගබඩා තුළ අගුල් දමා රදවා තිබුණු බව 2024 මාර්තු 25 දින සිදුකරන ලද පරීක්ෂාවේදී අනාවරණය විය. මෙහිදී වාහන පරිහරණය කරන ලද නිලධාරීන්, එම වාහන ලබා දී තිබුණු නිලධාරීන් හා දින වකවානු, මෙම වාහන කුමන කාර්යයන් සඳහා භාවිතා කළේද යන්න හා මෙම ස්ථානයේ ගාල් කළ නිලධාරීන් සම්බන්ධ විස්තර කිසිවක් ඉදිරි පත් කිරීමට කලාප කාර්යාලය අපොහොසත් වූයෙන් මෙම වාහන අවභාවිතා කර තිබුණේද යන්න වූ සැකය විගණනයේදී බැහැර කළ නොහැකි විය.	අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) ගේ සභාපතිත්වයෙන් යුත් නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත වාහන පරීක්ෂා කිරීමේ කමිටුව වෙත මෙම වාහන පරීක්ෂා කිරීමට යොමු කර ඇත. එම නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.	අනාරක්ෂිතව රජයට අයත් වාහන ගාල් කර තැබීම පිළිබඳව පත් කර ඇති කමිටුවේ පරීක්ෂාවන් කඩිනමින් නිමකරවා වාහන භාවිතයට ගත යුතු අතර මේ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන විනය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	වාරිමාර්ග අමාත්‍යාංශයේ වාහන විස්තරවලට ඇතුළත්වී නොමැති වුවද පිටස්තර ආයතනයන්ට අයත් වාහන 05 ක් අමාත්‍යාංශ පරිශ්‍රය තුල දිර්ඝ කාලයක සිට ගාල්කර තිබුණි. මෙසේ භාවිතයෙන් තොරව දිර්ඝ කාලයක සිට බාහිර පරිසරයට විවෘතව පැවතීම තුළ මේ වනවිට දිරා යාමේ දැඩි අවධානමකට මුහුණ දී තිබුණද, මෙම වාහන අමාත්‍යාංශ පරිශ්‍රයෙන් ඉවත් කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.	මෙම වාහන නැවත අදාල ආයතන වෙත භාර ගන්නා ලෙස දැනුම් දී ඇති අතර ඒ අනුව කටයුතු කිරීමට සටහන්කර ගතිමි.	අමාත්‍යාංශ පරිශ්‍රයෙන් මෙම වාහන ඉවත් කර හිමිකාරිත්වය දරන ආයතන වෙත භාරදීමට කඩිනම් පියවර ගත යුතුය.

4.5 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අනතුරකට මුහුණ දී තිබූ කැබ් රථයකට සිදුවී තිබූ රු.මි. 10.48 ක් වූ පූර්ණ අලාභයෙන් කිසිදු මුදලක් වගකිව යුතු පාර්ශවයෙන් අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.	කැබ් රථය අනතුරට පත්වීම සම්බන්ධයෙන් වරදකරු වී ඇති එම රථයේ රියදුරු ගෙන් රු.මි. 10.48 ක් වන අලාභ මුදල අයකර ගැනීමට නොහැකි වී ඇති බැවින් මෙම සිදුවීමට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන අමාත්‍යාංශයේ නීති නිලධාරි වෙත යොමු කර ඇති අතර එම ලිපි ලේඛන ඉදිරි කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමුකර ඇති බව නීති නිලධාරි විසින් දන්වා ඇත.	අලාභ මුදල අයකර ගැනීම සඳහාවූ නීතිමය කටයුතු කඩිනම් කළ යුතු අතර අලාභ අය කර ගැනිමට ක්‍රියා නොකළ නිලධාරින් සම්බන්ධයෙන් විනය ක්‍රියාමර්ග ගත යුතුය.

4.6 කළමණාකරන දූර්වලතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කොත්මලේ වාරිමාර්ග සහ ජල කළමණාකරනය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයෙහි ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා පැවැත්විම සඳහා 2017 ජුලි මස 18 දිනැති අංක 17/1456/729/017 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබි තිබුණු නමුත් අනුමැතිය ලැබිමට පෙර පුහුණු පාඨමාලා 02 ක් ද අනුමැතිය ලැබිමෙන් පසු පාඨමාලා 03 ක් පමණක් පවත්වා තිබූ අතර 2019 වර්ෂයෙන් පසු කිසිදු පාඨමාලාවක් පවත්වා නොතිබුණි.	විදේශ තානාපති කාර්යාල සමඟ සම්බන්ධිකරණය කර ගැනීම පිළිබඳ අමාත්‍යාංශයේ සහයෝගය විමසන ලදී. එමඟින් ලද උපදෙස් පරිදි වාරිමාර්ග විෂය දැනුම සහිත විශ්‍රාමික රජයේ නිපුණැති නිලධාරින් සම්බන්ධ කරගෙන පාඨමාලා මොඩියුලර් කිහිපයක් සැකසිමට මේ වන විට සැලසුම් කර ඇත.	ජාත්‍යන්තර පුහුණු පාඨමාලා පැවැත්විමට කටයුතු කළ යුතුය.
(ආ)	ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා ප්‍රචාරය කිරිමට ඇති ප්‍රධානතම මාධ්‍යක් ලෙස ආයතනයේ වෙබ් අඩවිය භාවිතා කිරිමට හැකියාව පැවැතුණ ද විදේශ සිසුන් ආකර්ශනය වන ආකාරයේ ප්‍රචාරයක් එමගින් සිදුකර නොතිබුණි.	ඒ ඒ අංශ අනුව වෙබ් අඩවියේ සැකසුම් සඳහා අවසර ලබා දී ඇති අතර එම අය විසින් අදාළ පරිදි සුදුසු යාවත්කාලින කිරිම් සිදු කළ යුතුය. තවද ආයතන කාර්ය මණ්ඩලයේ අඩුපාඩුකම් හා නිපුණතාවය සහිත පිරිසගේ හිඟතාවයද නිසා ලබා දුන් පුහුණුව නිසි පරිදි යොදා ගැනිමේ දූර්වලතාවයන්ද පවතී. ඒ අනුව මෙයද	විදේශ සිසුන් ආකර්ශනය කර ගැනීමට ආයතනයේ වෙබ් අඩවිය භාවිතා කළ යුතුය.

අප ආයතනය විසින් සිදු කළ යුත්තකි. තවද මෙහි තොරතුරු යාවත්කාලින කිරිම තවමත් සිදු වේ.

5. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරික්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 441 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 332 ක් විය. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 21 ක, තෘතීක මට්ටමේ තනතුරු 02 ක, ද්විතීක මට්ටමේ තනතුරු 69 ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 17 ක වශයෙන් පුරප්පාඩු 109 ක් පැවතුණි.	තනතුරු පුරප්පාඩු 109ක් පවතින බව ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) ගේ අංක MOI/AD/06/01/01(II) හා 2025 ජනවාරි 08 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2017 අනුව 2024 දෙසැම්බර් 31 දිනට අදාළ කාර්තු වාර්තාව අනුව ඉදිරිපත් කර ඇත. ඒකාබද්ධ රියදුරු සේවයේ පුරප්පාඩු දැනුම් දීම සඳහා 2024.10.15 දිනැති ලිපිය මඟින් රාජ්‍ය පරිපාලන. පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලුම් කර ඇත.	ආයතනික කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය සම්බන්ධව නැවත සමාලෝචනයක් සිදුකර අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය.
(ආ)	වාරිමාර්ග අමාත්‍යාංශය වෙත 2018 වර්ෂයේදී අනුයුක්ත කර තිබු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියෙකු සඳහා අමාත්‍යාංශයේ තනතුරු දෙකක්ද ඒ යටතේ පවතින සමාගමක ප්‍රධාන විධායක නිලධාරි හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සහ අමාත්‍යාංශය යටතේ වු ව්‍යාපෘතියක අධ්‍යක්ෂ ලෙසද වශයෙන් තනතුරු 4 ක වගකිම් පරිදි පවරා තිබුණි. 2019 සැප්තැම්බර් 15 දින සිට 2020 සැප්තැම්බර් 14 දින දක්වා ඔහුගේ නිත්‍ය තනතුරට අමතරව අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තාක්ෂණ විගණන) තනතුරෙහි රාජකාරි ඉටු කිරිම සඳහා පත් කිරිමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ආවරණ අනුමැතිය ලබා දි තිබුණද, 2023 දෙසැම්බර් දක්වාම අධ්‍යක්ෂ (තාක්ෂණ විගණන) තනතුරේ කටයුතු කර තිබුණි. තවද මෙම නිලධාරියා	අධ්‍යක්ෂ (තාක්ෂණ විගණන) තනතුරෙහි රාජකාරී ආවරණය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සමඟ සාකච්ඡා කර 2023.07.11 දින වෙනත් නිලධාරියෙකු අධ්‍යක්ෂ (තාක්ෂණ විගණන) තනතුර සඳහා පත්කර ඇත. නමුත් අතිරේක ලේකම් (පාලන) ගේ 2023.09.04 දිනැති අභ්‍යන්තර මැමය මඟින් සහ 2023.10.03 දිනැති ලිපිය මඟින් එම නිලධාරී මහතාහට රාජකාරී භාරදෙන ලෙස දැනුවත් කර ඇත. ඒ අනුව 2023.12.08 දින උක්ත තනතුරෙහි රාජකාරී භාරගෙන ඇත. මෙම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ඵලදායිතා සංවර්ධන සහ තාක්ෂණ විගණන අංශය) ලෙස සේවය කරන ලද ඉංජිනෙරුවරයා කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2019 හි 2.3.3(C) ප්‍රකාරව වැඩබැලීමේ පදනම මත අතිරේක ලේකම් ව්‍යාපෘති පිරිස් හා ප්‍රගති කළමනාකරුගේ 2020.09.29 දිනැති ලිපිය මඟින් වැව්ගම් පුබුදුව ව්‍යාපෘතියේ වැඩබලන ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස පත්කර ඇති බව දන්වා සිටිමි.	අධ්‍යක්ෂ (තාක්ෂණ විගණන) තනතුරෙහි රාජකාරි ඉටු කිරිම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දි තිබු ආවරණ අනුමැතිය ඉක්මවා කිසිදු අවසරයකින් තොරව සේවය කිරීම පිළිබඳව පරීක්ෂණයක් සිදු කිරීමටත්, ව්‍යාපෘති සඳහා සෑමවිටම පූර්ණ කාලීන පදනමින් ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් බඳවා ගැනිමටත් විධිමත් නොවන පත්වීම් හා ඒ මත සිදුකරනු ලබන වැටුප් ගෙවීම් නීත්‍යයානුකූල නොවන බැවින් එම ගෙවීම් අයකර ගැනීමට කටයුතු කල යුතුය.

	2020 සැප්තැම්බර් 28 සිට ක්‍රියාත්මක වන පරිදි වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන “වැව්ගම් පුබුදුව” ව්‍යාපෘතියේ වැඩ බලන ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ 2020 සැප්තැම්බර් 29 දිනැති ලිපිය මඟින් පත්කර තිබුණි. ඊට අමතරව පත්වීම් බලධාරීයාගේ විධිමත් අවසරයක් ලබා නොගෙන වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් මෙම නිලධාරියාව මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් හා ප්‍රධාන විධායක නිලධාරීයා ලෙසද 2021 ජනවාරි 07 දින හා 2021 දෙසැම්බර් 31 දින පත්කර මාසිකව රු. 52,342 ක දීමනාවක් ගෙවීම් කර තිබුණි.		
(ඇ)	විධිමත් අනුමැතියකින් තොරව වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් 2021 පෙබරවාරි 23 දිනැති ලිපියෙන් සංවර්ධන නිලධාරිනියක් මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්) සමාගමේ ව්‍යාපෘති කළමනාකරණ තනතුරේ රාජකාරි ආවරනය කිරීම සඳහා අනුයුක්ත කර තිබුණු අතර මෙම පත්වීමට අදාල තොරතුරු ඇයගේ පුද්ගලික ලිපිගොනුවට ඇතුලත් කර නොතිබුණි. තවද මෙසේ රාජකාරි ආවරනය කිරිම සඳහා පත්කර ඇති නිලධාරියෙකුට කිසිදු දීමනාවක් හෝ ගෙවිමක් ලබා ගැනිමට හිමිකමක් නොමැති වුවද මෙම නිලධාරිනිය සඳහා 2021 මාර්තු සිට මාසිකව රු 60,907 ක දිමනාවක් ගෙවා තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	විධිමත් නොවන පත්වීම් හා ඒ මත සිදුකරනු ලබන වැටුප් ගෙවීම් නීත්‍යයානුකූල නොවන බැවින් එය කඩිනමින් නිවැරදි කිරීමට පියවර ගත යුතුය.